# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50   +94112784846
isurupaya@moe.gov.lk   www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/9/15/1/6/1    ඔබේ යොමුව / உமது இல. / Your Ref. }    දිනය / திகதி / Date } 2020.01.02

**චක්‍රලේඛ අංකය : 02/2020**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>පාසල් දරුවන් සඳහා උදෑසන ශාරීරික ව්‍යායාම පැවැත්වීම.</u>**

"ඵලදායී පුරවැසියෙක් හා සතුටින් ජීවත්වන පවුලක්" තේමාවට අදාලව "ජව සම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවි බලය" යන අනු මාතෘකාව යටතේ ක්‍රීඩාව මඟින් මෙරට තරුණ පරපුර ජව සම්පන්න, නිරෝගිමත් සහ විනයගරුක පිරිසක් බවට පත්කිරීම අරමුණු කර ගනිමින් 2020 වර්ෂයේ නව පාසල් වාරය ආරම්භයේ සිට පාසල් දරුවන් සඳහා උදෑසන ශාරීරික ව්‍යායාම පැවැත්වීමේ වැඩසටහන සෑම පාසලකම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව මේ සම්බන්ධයෙන් මීට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අධ්‍යාපන ලේකම්ගේ අංක ED/1/15/2/2/100 හා 2006.03.18 දිනැති 2006/04 චක්‍රලේඛයේ පළමු ඡේදයේ සඳහන් 'පාසල් කාල සටහනේ විනාඩි 15ක කාලය' යන්න **'දිවයිනේ සියලුම පාසල් වල පාසල් කාල සටහනේ ප්‍රථම විනාඩි 20ක කාලයක් සතියට දින දෙකක් (02)'** ලෙස සංශෝධනය කරමි.

එහෙයින් ඔබ පළාතේ සියලුම පාසල්වල උදෑසන ශරීර සුවතා වැඩසටහන 2020 ජනවාරි 01 සිට අඛණ්ඩව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අවධාරණය කරමි.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්

පිටපත්

1. විගණකාධිපති - කරු.දැ.ගැ.පි.
2. සියලුම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
3. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் } +94112784832 +94112784835
ලේකම් / செயலாளர் } +94112784811